# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2213/11 - 2021 පෙබරවාරි මස 02 වැනි අඟහරුවාදා - 2021.02.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/78 (XVIII).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 48අ වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2020 අංක 05 දරන පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2020 දෙසැම්බර් මස 17 දින සිට බලාත්මක විය යුතු ය. පනතේ 48අ (1) වන වගන්තිය යටතේ පිහිටුවන ලද සියලුම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨවලට මෙම නියමාවලිය අදාළ වන්නේ ය.

2. පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, පනතේ 48අ (1) වන වගන්තිය යටතේ පිහිටුවන ලද (මෙහි මින්මතු "පීඨය" යනුවෙන් සඳහන් කරනු ලබන)පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක්, අදාළ විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව විසින් එකඟ වනු ලැබිය හැකි පරිදි වූ, යම් අධ්‍යයන ක්ෂේත්‍රයක පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ සහ උසස් උපාධි දක්වා යොමුවන අධ්‍යයන පාඨමාලා හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සැපයීමේ පරිපාලන මධ්‍යස්ථානය විය යුතු ය.

3. පීඨය විසින්, විශ්වවිද්‍යාලය තුළ කරගෙන යනු ලබන පශ්චාත් උපාධි අධ්‍යයන සහ විශේෂ හෝ විෂයාන්තර පර්යේෂණ ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය සහ නියාමනය කළ යුතු අතර, අදාළ විශ්වවිද්‍යාලයේ සනාථන සභාවේ නියෝගවලට සහ පාලනයට යටත්ව පීඨයට පහත දැක්වෙන බලතල ඇත්තේ යඃ-


1A - PG 5296 — 175(2021/02)

*මෙම ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) පශ්චාත් උපාධි ප්‍රවේශය සඳහා වූ අවශ්‍යතා, පාඨමාලා අවශ්‍යතා, පාඨමාලාවල අන්තර්ගතයන් සහ විභාග පටිපාටි නිශ්චිතව සඳහන් කිරීම, විශ්වවිද්‍යාලවලට අනුබද්ධිත පශ්චාත් උපාධි ආයතනවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍යයන් හැර අනෙකුත් ශිෂ්‍යයන් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ඇතුළත් කර ගැනීම;

(ආ) කොමිෂන් සභාවේ අනුමතයෙන් පසුව, ඉල්ලුම අනුව සහ පරදු දරන්නන්ගේ පසු විපරම මත පදනම් වූ නව පශ්චාත් උපාධි පාඨමාලා හඳුනාගැනීම සහ හඳුන්වාදීම;

(ඇ) විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉගැන්වීමේ සහ පර්යේෂණවල තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රමිති ඇති කිරීම සහ නියාමනය කිරීම;

(ඈ) තරඟකාරී පර්යේෂණ යෝජනාවලි සකස් කිරීමට සහ කලාපීය, ජාතික සහ අන්තර්ජාතික ගැටළු ආමන්ත්‍රණය කරන්නා වූ ශුද්ධ හෝ ව්‍යවහාරික සහ විෂයාන්තර පර්යේෂණ පැවැත්වීම සඳහා ශිෂ්‍යයන්ට සහාය වීම;

(ඉ) පර්යේෂණ ආචාරධර්මවලට අනුකූලවීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම සහ අවශ්‍ය නම් ආචාරධර්මික නිෂ්කාසනය ලබාගැනීමේ දී ඔවුන්ට පහසුකම් සැලැස්වීම;

(ඊ) ප්‍රකට පර්යේෂණ මාර්ගයෙන් නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම;

(උ) පර්යේෂණ උපාධි, පැවැත්වීම සඳහා අවශ්‍ය කරන අධීක්ෂකවරු, සම අධීක්ෂකවරු සහ වෙනත් සම්පත්දායකයන් ලෙස පත් කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම;

(ඌ) බාහිර කථිකාචාර්යවරු, පරීක්ෂකවරු සහ සම්බන්ධීකාරකවරු ලෙස පත් කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම;

(එ) උසස් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා ශිෂ්‍යයන් නිර්දේශ කිරීම;

(ඒ) පශ්චාත් උපාධි ඉගැන්වීම් සහ පර්යේෂණවල දී අන්තර්-පීඨ, පීඨ ඇතුළත සහ අන්තර් විශ්වවිද්‍යාල සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම;

(ඔ) පර්යේෂණ කිරීම, ඒ පර්යේෂණවලින් සොයාගත් කරුණු සමුළුවල දී සහ සම්මන්ත්‍රණවල දී ඉදිරිපත් කිරීම සහ ඒවා මුද්‍රිත වාර්තා හෝ සඟරාවල පළකිරීම මගින් අවශ්‍ය නිපුණතා දියුණු කර ගැනීමට ශිෂ්‍යයන්ට පහසුකම් සැලැසීම;

(ඕ) පර්යේෂණ භාරගැනීමට ශාස්ත්‍රධරයන් ධෛර්යමත් කිරීම සහ එවැනි පර්යේෂණ සඳහා සහ දැනුම බෙදාහැරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලැසීම;සහ

(ක) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත වෙනත් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ සහ පාඨශාලා, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ කර්මාන්ත සමග සම්බන්ධතා ඇති කර ගැනීම සහ පවත්වාගෙන යෑම.

4. (1) පීඨය සඳහා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු පීඨාධිපතිවරයකු සිටිය යුතු අතර, ඔහු පීඨයේ අධ්‍යයන සහ පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රධානයා විය යුතු ය.

(2) පීඨයේ ප්‍රථම පීඨාධිපතිවරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඊට පසුව පත්වන පීඨයේ සෑම පීඨාධිපතිවරයකු ම පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් පාලක සභාවට නිර්දේශ කරනු ලබන විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්යවරු, මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු අතරින් තිදෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින්, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) පීඨයේ පීඨාධිපතිවරයා ඔහුගේ පත්වීමේ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර,

(අ) පීඨයේ පළමුවන පීඨාධිපතිවරයා සම්බන්ධයෙන් වන විට, කොමිෂන් සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නො අඩු සංඛ්‍යාවකින් සම්මත කර ගන්නා ලද දෝෂාරෝපණ යෝජනාවක් මත කොමිෂන් සභාව විසින්; සහ

(ආ) ඊට පසුව පවත්වන පීඨයේ සෑම පීඨාධිපතිවරයකු සම්බන්ධයෙන් වන විට, කලින් ඉවත් කර ඇත්නම් මිස, තත්කාර්ය සඳහා කැඳවන ලද පාලක සභාවේ විශේෂිත රැස්වීමක දී, පාලක සභාවේ මුළු සමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් සම්මත කර ගන්නා ලද දෝෂාරෝපණ යෝජනාවක් මත පාලක සභාව විසින්,

ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුසු වන්නේ ය.

(4) පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් පත්කරන ලද තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, දෙපාර්තමේන්තු ප්‍රධානයකු ලෙස හෝ විශ්වවිද්‍යාලයේ පීඨයක පීඨාධිපතිවරයකු ලෙස ධුර දරමින් සිටියේ නම්, පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ විට, ඔහු විසින් එකී යම් ධුරයක් දැරීම නතර විය යුතු ය.

(5) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට පීඨයේ පීඨාධිපතිවරයා තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, පීඨාධිපතිවරයාගේ ධුරයේ කාර්ය කරගෙන යෑම සඳහා සුදුසු යැයි පාලක සභාව සිතන යම් වැඩපිළිවෙලක් පාලක සභාව විසින් යොදනු ලැබිය යුතු ය.

(6) පීඨයේ පීඨාධිපතිවරයා විශ්‍රාම ගත් විට හෝ ඉල්ලා අස්වූ විට හෝ මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි වූ විට, පීඨාධිපතිවරයාගේ තනතුර පුරප්පාඩු වී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, (2) වන උප-නියමාවලියේ විධිවිධානවලට අනුකූලව අලුත් පීඨාධිපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(7) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන පීඨාධිපතිවරයකුට, ඔහු එසේ පීඨාධිපතිවරයකු වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව යම් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු ඒ නිත්‍ය තනතුරේ විශ්‍රාම යන වයසට ළඟා වී නැත්නම්, ඔහු ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ඔහු දැරූ නිත්‍ය තනතුරට ආපසු පත් කරනු ලැබිය හැකි ය.

5. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලයක් තිබිය යුතු යː-

(1) පහත දැක්වෙන නිලබලයෙන් පත් වූ සාමාජිකයන්ː-

(අ) සභාපතිවරයා විය යුතු පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා;

(ආ) අධ්‍යයන සභාවල සභාපතිවරු;

(ඇ) විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල පීඨාධිපතිවරු;

(2) පහත දැක්වෙන නම් කරන ලද සාමාජිකයන්ː-

(අ) පනතේ 44 (1) (vii) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි,පාලක සභාවේ පත්කළ සාමාජිකයන් අතරින් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු;

(ආ) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පැමිණි තැනැත්තන් අතරින්, විශ්වවිද්‍යාල සනාථන සභාව විසින් නම් කරනු ලබන, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන සාමාජිකයන් දෙදෙනකු;

(ඇ) පීඨයේ අධ්‍යයන සභාවල පශ්චාත් උපාධි මට්ටමේ වූ ආචාර්යවරයන් අතුරින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පාලක සභාව විසින් නම් කරන ලද එක් සාමාජිකයකු.

(3) මණ්ඩලයේ නම් කරන ලද එක් එක් සාමාජිකයකු, ඔහු විසින්, කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහුව නම් කරන ලද දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, නැවත නම් කිරීමට යෝග්‍ය වන්නේ ය.

(4) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ජ්‍යෙෂ්ඨතම පරිපාලන නිලධරයා මණ්ඩලයේ ලේකම්වරයා ලෙස සේවය කළ යුතු ය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණ පූර්ණය එහි සාමාජිකයන්ගෙන් තුනෙන් එකක් විය යුතු ය.

(6) මණ්ඩලය විසින් යම් විශේෂිත කාර්යයක් සඳහා සහ විශේෂිත කාලසීමාවක් සඳහා එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් මණ්ඩලයට සමාග්‍රහණය කරගනු ලැබිය හැකි නමුත්, එසේ සමාග්‍රහණය කරන ලද යම් තැනැත්තකුට මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(7) පීඨයේ පීඨාධිපතිවරයා අමතන ලද ස්වකීය අත්සනින් යුත් ලිපියක් මගින් මණ්ඩලයේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගී වී නොමැති මණ්ඩලයේ යම් නම් කරන ලද සාමාජිකයකු , ස්වකීය ධුරය අත්හරිනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර, (2) වන උපනියමාවලියේ විධිවිධානවලට යටත්ව ඒ පුරප්පාඩුව පිරවීමට වෙනත් යම් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(9) සාමාජිකයකුගේ ධුර කාලය අවසන් වීම, ඉල්ලා අස්වීම ධුරයෙන් ඉවත් කිරීම හෝ වෙනත් යම් හේතුවක් මත මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුර දැරිය යුතු ය.

(10) සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීමට ඔවුන් අතුරින් යම් සාමාජිකයකු තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

(11) මණ්ඩලය අවශ්‍ය ඕනෑම අවස්ථාවක රැස්විය යුතු අතර, කෙසේ වුව ද, එය එක් එක් වර්ෂය තුළ වාර දහයකට නොඅඩු අවස්ථා ගණනක දී රැස්විය යුතු ය.

6. (1) පනතේ සහ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත්ව සහ සනාථන සභාවේ විධිවිධානවලට යටත්ව, පීඨයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ, විභාග, කර්මාන්ත-පීඨ හවුල්කාරිත්ව, පීඨ-ප්‍රජා අන්තර් ක්‍රියා පිළිබඳ සහ දැනුම පතුරුවා හැරීම පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය මණ්ඩලය සතු විය යුතු ය.

(2) (1) වන උපනියමාවලිය මගින් එයට පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු යඃ-

(අ) පීඨයට අදාළ සියලු කාරණා නියාමනය කිරීම සහ නිශ්චය කිරීම ;

(ආ) යම් විශේෂිත කාර්ය සඳහා පීඨයේ අභිමතය පරිදි වෙන් කළ යම් අරමුදල් පරිපාලනය කිරීම ;

(ඇ) පීඨයේ මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒවා විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඈ) පීඨය තුළ විවිධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රවල දී ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සහ එවැනි උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීමට අදහස් කරන ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණුවීම්, සමත්විය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඉ) ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන් සහ පරීක්ෂක මණ්ඩලයේ ස්වභාවය සහ සංයුතිය පිළිබඳ සනාථන සභාවට නිර්දේශ කිරීම ;

(ඊ) රීති සෑදීමට බලය ලබා දෙන යම් කාරණා සම්බන්ධයෙන් රීති සම්පාදනය කිරීම ;

(උ) පීඨයක තත්කාලයේ පවතින අධ්‍යයන විෂය ක්ෂේත්‍ර ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනා ක්‍රම පිළිබඳ සනාථන සභාවට සහ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ඌ) සනාථන සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව, පීඨයකට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ කොන්දේසි නිශ්චය කිරීම ;

(එ) පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් සනාථන සභාවට නිර්දේශ කිරීම ;

(ඒ) ශාස්ත්‍රීය උපදේශන කමිටුවක් සහ සුදුසු යයි මණ්ඩලය අදහස් කරන පරිදි යම් අනුකමිටු සංඛ්‍යාවක් පත් කිරීම;

(ඔ) අවශ්‍ය නම්, පීඨවල ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පීඨය තුළ ඒකක පිහිටුවීම; සහ

(ඕ) යම් අධ්‍යයන අංශයක විෂයය නිර්දේශ, අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීම් සහ පර්යේෂණ සම්බන්ධයෙන් සහ පශ්චාත් උපාධි ඉගැන්වීම් සහ පර්යේෂණවල දී, විෂයාන්තර අධ්‍යයන සහ අන්තර් පීඨ සහ අන්තර් විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර සහයෝගීතාවය සඳහා වූ පහසුකම් පිළිබඳ සනාථන සභාවට නිර්දේශ කිරීම.

7. (1) විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව විසින්, කලින් කලට, එකඟ විය හැකි පරිදි පීඨයට යම් අධ්‍යයන සභා සංඛ්‍යාවක් පැවතිය යුතු ය.

(2) එක් එක් අධ්‍යයන සභාවේ සාමාජිකයන් ලෙස පහත දැක්වෙන තැනැත්තන්, ඒ පත් කිරීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාලසීමාවක් සඳහා ඇතුළත් කරනු ලැබිය හැකි අතර, එවැනි සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය :-

(අ) විශ්වවිද්‍යාලයේ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු හෝ මහාචාර්යවරු ;

(ආ) පශ්චාත් උපාධි ඉගැන්වීම් හෝ පර්යේෂණ වැඩසටහන් පවත්වන අදාළ අංශවල ප්‍රධානීන් ;

(ඇ) විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වැඩසටහන්වල සම්බන්ධීකාරකවරු ;

(ඈ) අධ්‍යයන සභාවේ සභාපතිවරයාගේ නිර්දේශය මත සනාථන සභාව විසින් පත් කරනු ලබන විශිෂ්ට ශාස්ත්‍රඥයකු විය යුතු විශ්වවිද්‍යාලයට බාහිරින් පත් කළ නාමිකයකු.

(3) එක් එක් අධ්‍යයන සභාවට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු සහ මහාචාර්යවරු අතරින් පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් පත්කරනු ලබන සභාපතිවරයකු සිටිය යුතු ය. එසේ වුව ද, ව්‍යතිරේක අවස්ථානුගත කාරණාවක දී, පීඨයේ පීඨාධිපතිවරයාගේ නිර්දේශය මත පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් ඒකමතික තීරණයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු හෝ මහාචාර්යවරයකු නොවන තැනැත්තකු සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(4) අධ්‍යයන සභාවේ සභාපතිවරයකු, පත් කිරීමේ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධූර දැරිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා සුදුසු වන්නේ ය.

8. එක් එක් අධ්‍යයන සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් එය වෙත යොමු කරනු ලබන යම් කාරණා පිළිබඳ සලකා බලා වාර්තා කිරීම ;

(ආ) ඒ අධ්‍යයන සභාවේ අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන් සහ විභාගවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳ නිර්දේශ සහ වාර්තා පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) යම් විශේෂ විෂයය පිළිබඳ සලකා බැලීමේ සහ වාර්තා කිරීමේ කාර්යය සඳහා කමිටු පත් කිරීම;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වූ කොන්දේසි පිළිබඳව පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(ඉ) ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගනු ලැබීමට සුදුසු තැනැත්තන් පිළිබඳව පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(ඊ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(උ) තත්කාලයේ පවත්නා අධ්‍යයන සභා ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අවශ්‍ය නම් අලුත් අධ්‍යයන සභා පිහිටුවීම සඳහා වූ යෝජනා ක්‍රම පිළිබඳව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම; සහ

(ඌ) නියමිත විභාග සමත් වී ඇති සහ නියමිත වෙනත් කොන්දේසි සපුරා ඇති තැනැත්තන් පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා යෝග්‍ය බවට පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

9. පීඨයට, සනාථන සභාව විසින් පත් කරන ලද ආචාර ධර්ම කමිටුවක් තිබිය යුතු ය. කමිටුවට, විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් අනුමත කරන ලද නිර්ණේය විෂයයන් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් තිබිය යුතු ය. ඒ කමිටුවේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ:-

(අ) සම්මන්ත්‍රණ, වැඩමුළු සහ මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම් හෝ වැඩසටහන් පැවැත්වීම මගින් පර්යේෂණ ආචාර ධර්ම ඉගෙනීමට සහ භාවිත කිරීමට පශ්චාත් උපාධි ශිෂ්‍යයන් උනන්දු කිරීම;

(ආ) ආචාරධර්ම කමිටුවට ලැබුණ ඉල්ලුම්පත් ඇගැයීම සහ ආචාරධර්ම කමිටුව විසින් නියම කරන ලද රීති සහ නියෝගවලට අනුකූලව, ආචාර ධර්ම නිෂ්කාසනය ලබාදීම;

(ඇ) පර්යේෂණ පැවැත්වීමේදී සහ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු මුද්‍රණය කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී පර්යේෂණ සිදු කරන ශිෂ්‍යයන් විසින් ආචාර ධර්ම පිළිබඳ මූලධර්ම අනුගමනය කරනු ලබන බවට සහතික වීම.

10. පීඨයේ ආචාර්ය මණ්ඩලයः-

(අ) අවශ්‍ය පර්යේෂණ පළපුරුද්ද සහ ප්‍රකට ශාස්ත්‍රීය ජයග්‍රහණ සහිතව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය හෝ ඉන් ඉහළ තනතුරක් දරන්නාවූ, විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය අතුරින්, පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් සඳහා පාලක සභාව විසින් ද;

(ආ) අරමුදල් හෝ ප්‍රදානයන් තිබීමට යටත්ව, මාස විසි හතරකට නොවැඩි යම් කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාලයට පරිබාහිරව, බාහිර මහාචාර්යවරයන් අතරින් ද;

(ඇ) විධිමත් අධ්‍යාපනික සුදුසුකම් නොමැති එහෙත්, ඔවුන් සතු ප්‍රායෝගික පුහුණුව සහ පළපුරුද්ද හේතු කොට ගෙන, ආචාර්ය තනතුරක් දැරීමට අන්‍යාකාරයකින් උසස් සුදුසුකම් තිබිය හැකි ආරාධිත කථිකාචාර්යවරු අතරින් ද,

පත් කර ගනු ලැබිය යුතු ය.

11. පීඨයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

12. එක් එක් අධ්‍යයන වැඩසටහන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද සහ පාලක සභාව විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තුවක් මත විය යුතු ය.

13. පීඨය විසින් එහි කටයුතුවලට අදාළ ගිණුම් සහ දත්ත පිළිබඳ වාර්ෂික ප්‍රකාශනයක්, විශ්වවිද්‍යාලය මගින්,කලින් කලට, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් ආකෘතියකින් සහ යම් ආකාරයකින් සහ යම් තොරතුරු ඇතුළත් කරමින් සකස් කරනු ලැබිය යුතු ය.

14. මේ නියමාවලියේ-

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"උචිත සාධනපත්‍රය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් අදහස් වේ ;

"පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය" යන්නෙන් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ මණ්ඩලය අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

"පාලක සභාව" යන්නෙන්, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"පීඨයේ පීඨාධිපතිවරයා" යන්නෙන් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා අදහස් වේ ;

"වෙනත් පීඨාධිපතිවරු" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය හැර වෙනත් පීඨවල පීඨාධිපතිවරු අදහස් වේ ;

"විශ්වවිද්‍යාලය" යන්නෙන්, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ස්ථාපිතව ඇති විශ්වවිද්‍යාලය අදහස් වේ ;

15. 1987 සැප්තැම්බර් 30 වන දින සහ අංක 473/9 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1987 අංක 03 දරන නියමාවලිය, එකී නියමාවලිය යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

01-91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.